**10 ශ්‍රේණිය. 2021**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**පළමු වාරය - දෙවන සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

1. ඔබගේ සිංහල පෙළ පොතෙහි ''අතීතයෙන් කතාවක්'' පාඩම නිහඬව කියවන්න.

2. වංශ කතා සාහිත්‍යය අතර මහාවංශයට හිමි තැන පිළිබඳ කරුණු එක් රැස් කරන්න.

3. මාතෘකානුකූලව කතාවක් සිදුකරන ආකාරය පිළිබඳ අවධානය යොමු කර පන්තිය ඉදිරියේ පැවැත්වීමට සුදුසු කතාවක් නිර්මාණය කරගන්න.

4. ''මිශ්‍ර'' ක්‍රියාව හඳුනාගන්න.
   - මිශ්‍ර ක්‍රියාව නිර්වචනය කරන්න.
     ''කිසියම් වාක්‍යයක පවත්නා ප්‍රධාන ක්‍රියාව සමඟ මිශ්‍ර වෙමින් හෙවත් බද්ධ වෙමින් පවත්නා ක්‍රියාව හඳුන්වනු ලබන්නේ මිශ්‍ර ක්‍රියාව යනනමිනි.''
   - මිශ්‍ර ක්‍රියාව සෑදෙන අයුරු
     - 'මින්' ප්‍රත්‍යය එකතු වීමෙන් - කරමින්, බලමින්, නටමින්, ගයමින්
     - 'මින' ප්‍රත්‍යය එකතු වීමෙන් - කරමින, බලමින, නටමින, ගයමින
     - 'මිනා' ප්‍රත්‍යය එකතු වීමෙන් - කරමිනා, බලමිනා, නටමිනා, ගයමින්
     - 'මිනි' ප්‍රත්‍යය එකතු වීමෙන් - කරමිනි, බලමිනි, නටමිනි, ගයමිනි
     - 'මිනේ' ප්‍රත්‍යය එකතු වීමෙන් - කරමිනේ, බලමිනේ, නටමිනේ, ගයමිනේ

   - මීට අමතර ව පූර්ව ක්‍රියාව දෙවරක් යෙදීම මගින් ද මිශ්‍ර ක්‍රියාව සෑදේ
     - කරකර, කර කරා, නට නට, නට නටා, බල බල, බල බලා

5. අතීතයෙන් කතාවක් පාඩමෙහි ඇති මිශ්‍ර ක්‍රියා පද උපුටා දක්වන්න.
6. අතීතයෙන් කතාවක් පාඩම කියවා එහි අභ්‍යාස කරන්න.

* * *

සැකසුම
දෙහිඕවිට අධ්‍යාපන කලාපය
සිංහල අංශය.